# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2122/20 – 2019 මැයි 08 වැනි බදාදා – 2019.05.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2015.02.20 වැනි දින අංක 1902/48 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2015 අංක 25 හා 2015.02.12 වැනි දින දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද, ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 08 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, පහත උපලේඛනයේ සඳහන් අංක : කේ/ඩීආර්එන්/2010/152 හා 2010.11.19 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කැබලි අංක 1, 2 සහ 3 ඇතුළත් සම්පූර්ණ ඉඩම මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

*මගේ අංකය:* LD/05/2010/VE/75.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: DER/LAN/ACQUI/A1/06.
2019 අප්‍රේල් මස 09 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අටලුගම් කෝරළේ නැගෙනහිර සුළු කොට්ඨාසයේ, දූරණියගල දකුණ ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක කේ/ඩීආර්එන්/2010/152 හා 2010.11.19 දිනැති ප්‍රගමන අනුරේඛනයේ දක්වා ඇති නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කොටස්වලට මායිම් :

01. **කැබලි අංක 1 – කැබෙල්ලලන්ද – ප්‍රමාණය: හෙක්. 0.0992**
උතුරට: අ.ග.පි. 621 හි කැබලි අංක 459 සහ කුඹුරුගන් ඔය; නැගෙනහිරට: අ.ග.පි. 621 හි කැබලි අංක 459 සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ අ.ග.පි. 621 හි කැබලි අංක 1533; බටහිරට: කුඹුරුගන් ඔය සහ අ.ග.පි. 621 හි කැබලි අංක 1533.

02. **කැබලි අංක 2 – නම සඳහන් නොවේ – ප්‍රමාණය: හෙක්. 0.0458**
උතුරට: අ.ග.පි. 621 හි කැබලි අංක 459; නැගෙනහිරට: මෙම අනුරේඛනයේ කැබලි අංක 3; දකුණට: මාර්ගය; බටහිරට: අ.ග.පි. 621 හි කැබලි අංක 1533 සහ මෙම අනුරේඛනයේ කැබලි අංක 1.

03. **කැබලි අංක 3 – කැබෙල්ලලන්ද – ප්‍රමාණය: හෙක්. 1.0947**
උතුරට: අ.ග.පි. 621 හි කැබලි අංක 459 සහ 1533; නැගෙනහිරට: අ.ග.පි. 621 හි කැබලි අංක 1533, 1608, 1609, 1613 සහ 1614; දකුණට: අ.ග.පි. 621 හි කැබලි අංක 1614 සහ මාර්ගය; බටහිරට: මාර්ගය.

05 - 530

1A – G30018 – 21 (2019/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*